# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 මාර්තු මස 21 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.31 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කොලන්නගේ වජිර පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අමල් සිල්වා
ඈ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවරදන්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රොජර් සෙනෙවිරත්න
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*උපදේශක කාරක සභා සඳහා පත් කිරීම් :*

*2017.03.14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි,*

*"අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජික ලයනල් ජයසිංහ ගරු මන්ත්‍රීතුමා වෙනුවට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාවත්,*

*සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජික ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා වෙනුවට ලයනල් ජයසිංහ ගරු මන්ත්‍රීතුමාවත් නම් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*බස්නාහිර පළාත් සභාවේ මුල් පළාත් සභාවේ සිට මන්ත්‍රීවරයෙක් වශයෙන් සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් කටයුතු කරපු ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ එඩ්වඩ් සිල්වා හිටපු ගරු මන්ත්‍රීතුමා පසුගියදා අභාවප්‍රාප්ත වුණු බවත්, එතුමාගේ ආදාහන උත්සවය බදාදා සවස 3.30 ට රාගම කතෝලික දේවස්ථානයේ සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2017.03.08 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

## 03. රීති අංක 107 යටතේ යෝජනාව :

යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : සභාපති පළාත් කථානායක ලෙසත්, නියෝජ්‍ය සභාපති පළාත් නියෝජ්‍ය කථානායක ලෙසත් සංශෝධනය කිරීමටත්, අනිකුත් ධූරධාරී තනතුරුත් ඇතුළත් කරමින් පළාත් සභා පනත සංශෝධනය කිරීමට ඉල්ලා සිටීම.

යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"පළාත් සභාවේ සභාපති හා නියෝජ්‍ය සභාපති යන තනතුරු නාමයන් පළාත් කථා නායක හා පළාත් නියෝජ්‍ය කථානායක වශයෙන් තනතුරු නාමයන් ලෙස සංශෝධනය කිරීමටත්, පළාත් සභාවේ සභානායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන ධූරයන් පළාත් සභා පනතෙහි ඇතුළත් කිරීම සඳහා පළාත් සභා පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලෙසට බස්නාහිර පළාතේ පළාත් සභාව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පක්ෂව 40 යි, විපක්ෂව 07 යි, වැළකුණු 01 යි යනුවෙන් බෙදුණේය.***

***පූ.භා. 10.45 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනාරූඪ විය.***

## 05. **පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : [ගණ පූරණය නොමැතිව කල් ගියේය.]**

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇති කර ගනිමින් රටේ අනාගතය සුරක්ෂිත කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාත් ගරු අග්‍රාමාත්‍යතුමාත් එක්ව යහපාලන රජයක් බිහිකරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරන මෙහෙවරට බස්නාහිර පළාතේ පළාත් සභාව සිය ස්තූතිය පළ කර සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 10.54 ට ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්,***

***පූ.භා. 10.57 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.17 ට යළිත් රැස්විය.***

***අ.භා. 01.44 ට ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය යළිත් නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්,***
***අ.භා. 01.49 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 01.57 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

## 06. **12(1) රීතිය යටතේ කල් තැබීම :**

**එතෙකුදු වුවත් ගණපූරණය නොමැති වූයෙන්**, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් සිය යෝජනාව සම්බන්ධයෙන් රීති අංක 15(7) ප්‍රකාර කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදුව, එකී යෝජනාවේ ඉදිරි කටයුතු ඊළඟ සභාවට යොමු කරමින් ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.00 ට, 2017 අප්‍රේල් මස 04 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.03.21
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.